**ඇල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඇල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශයතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.394,080,224 ක් වුවද, ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමේ රු.394,379,690 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.9,903,307 ක් තුළ ඇතුළත් 2023 වර්ෂයට ගෙවිය යුතු රු.918,813 ක් ජංගම වගකීම් ලෙස වෙන්කර ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී දුම්රිය බලපත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු රු.50,750 ක් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පුවත්පත් දැන්වීමකට ගෙවිය යුතු රු.25,599 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 328,799,949 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි, තක්සේරු වාර්තා, ලේඛන භෞතික පැවැත්ම සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (අ) | 132(ඔ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී විහාරස්ථානයක ධර්මශාලාවේ තීන්ත ආලේප කිරීම සහ | ලියාපදිංචි සමිති මඟින් ගිවිසුම්ගත වී අදාළ | ආගමික ස්ථාන සඳහා ලබා දෙන ආධාර සහ වියදම් සඳහා විෂයභාර |

| | | | | |
|---|---|---|---|---|
| | | කෝවිලක තීන්ත ආලේප කිරීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.256,982 ක් වැය කර තිබුණි. | කාර්යයන් ඉටු කර ඇත. | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | 182 වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගෙන් අනුමැතියකින් තොරව රු.1,252,000 ක ජල බදු කපා හැර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අයවිය යුතු මුදල් අත්හැරීමේදී පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 4,873,204 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,817,225 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තු ගත ආදායම රු. | බිල්කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල්කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| **(i)** | වරිපනම් බදු | 8,755,800 | 8,192,102 | 4,332,323 | **3,859,779** | 9,306,000 | 8,677,500 | 3,022,013 | **5,655,487** |
| **(ii)** | කුලී | 900,000 | 952,285 | 489,529 | **462,756** | 900,000 | 1,014,600 | 442,625 | **571,975** |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 1,572,200 | 985,000 | 985,000 | **0** | 1,525,000 | 1,018,220 | 1,018,220 | **0** |
| **(iv)** | වෙනත් ආදායම් | 17,767,000 | 17,022,080 | 6,163,800 | **10,858,280** | 21,320,000 | 15,107,339 | 12,866,590 | **2,240,749** |
| | එකතුව | **28,995,000** | **27,151,467** | **11,970,652** | **15,180,815** | **33,051,000** | **25,817,659** | **17,349,448** | **8,468,211** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 3,274 කින් අයවිය යුතු රු. 13,117,977 ක වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි වරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුදී තිබුණු කඩ කාමර 28 කින් රු.591,764 ක හිඟ කඩ කාමර කුලී අය කරගෙන නොතිබුණි . | හිඟ කුලී අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇති බව. | හිඟ හිටි කඩකුලී කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට පවත්වාගෙන එන කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට සහ 2020 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ආදාහනාගාරයට පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | ආදාහනාගාරයට හා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතුය. |
| (ආ) | ප්‍රදේශයේ මංමාවත් අලුත්වැඩියා කිරීම සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ලබා දීමට ප්‍රාදේශීය සභාව පියවර ගත යුතු වුවද, දේශීය හා විදේශීය සංචාරකයින් විශාල වශයෙන් පැමිණෙන ඇල්ල ප්‍රදේශයේ ආරුක්කු 09 පාලම සහ පුංචි ශ්‍රීපාදය සඳහා පිවිසුම් මාර්ග සංවර්ධනය කර නොතිබුණු අතර, වැසිකිලි පහසුකම්ද සපයා නොතිබුණි. | ඉඩම් නිරාකරණ ගැටළු හේතුවෙන් මෙම ස්ථානයේ සංවර්ධන කටයුතු ඇණහිට ඇති බව. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව මංමාවත් අලුත් වැඩියා කිරීම සහ වැසිකිළි පහසුකම් ලබා දීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව විසින් මහජනතාවට පානීය ජලය සැපයීමට පවත්වාගෙන යන ජල ව්‍යාපෘති 23 ක ජලය පරිභෝජනයට යෝග්‍ය බවට ජල සාම්පල පරීක්ෂා කර තහවුරුවක් ලබාගෙන නොතිබුණි. | ජල සාම්පල් පරීක්ෂා කර වාර්තා ලැබී ඇති බවත්, එහි සඳහන් උපදෙස් අනුව ක්‍රියා කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වා ඇති බව. | පරිභෝජනයට සුදුසු ජලය ලබා දිය යුතුයි. |
| (ඇ) | ගොඩනැඟිල්ලේ අනාරක්ෂිත බව හේතුවෙන් සභාවට අයත් කායවර්ධන මධ්‍යස්ථානයේ කටයුතු 2021 පෙබරවාරි 19 දිනෙන් පසු නතර කර තිබුණු අතර එහි උපකරණ වසර 02 ක කාලයක සිට අනාරක්ෂිතව හා නිෂ්කාර්යව සභාවේ පැවතුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් ගොඩනැගිල්ල සම්බන්ධ නිර්දේශ ලබා දෙන තෙක් ගොඩනැගිල්ල භාවිත නොකරයි. කාය වර්ධන මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීමට සභාවේ අවධානය යොමුව ඇති බව. | නිෂ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තියට අනුව 2022 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් 10 ක් පිළිබඳ තාක්ෂණික නිලධාරි විසින් හඳුනාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සඳහා නිවාස හා නගර ආඥා පනතේ නඩු පවරා නොමැති බවත්, මේ පිළිබඳ විවිධ අවස්ථාවල සාකච්ඡා කර ඇතත් මේ සඳහා කිසිදු පිළිතුරක් ලැබී නොමැත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ අරමුදලින් රු.490,500 ක් වැය කර මිලදීගෙන තිබුණු විෂබීජනාශක දියර ලීටර් 545 ක් කල් ඉකුත් වී ප්‍රාදේශීය සභා ගබඩාවේ ගබඩා කර තිබුණි. | මෙම විෂබීජනාශක දියර කොටසක් සෞඛ්‍ය සත්කාර ඒකක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වෙත බෙදා දෙන ලදී. කාර්යාල පිරිසිදු කිරීමේ කටයුතු/ වැසිකිලි පවිත්‍රකාරකයක් ලෙසද යොදා ගෙන ඇති බව. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |